අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

# අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

**2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත බලාත්මක කිරීම සඳහා පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ පවතින පහත සඳහන් කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 1. අධ්‍යක්ෂ ජනරාල් (කොන්ත්‍රාත් පදනම) HM 2-3 (තනතුරු 01)

<u>වැටුප් පරිමාණය</u>
HM 2-3 රු. 173,000-12x4,850 - 231,200
<u>මූලික වැටුප් පියවර</u>
**2025.01.01** දිනට ගෙවන මුදල් රු. 127,651.00, **2026.01.01** දිනට ගෙවන මුදල් රු. 150,325.00
**2027.01.01** දිනට ගෙවන මුදල් රු. 173,000.00
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2025/01හි උපලේඛණයට අනුව 2025/01/01-2025/12/31)

**<u>සුදුසුකම් හා පළපුරුද්ද :</u>**

නීතිය, පරිපාලනය හෝ අපරාධ විද්‍යාව යන ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු වීම

සමඟ

අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ අදාළ රාජ්‍ය නොවන හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 15ක පළපුරුද්දක් ලබා තිබීම (අවම වශයෙන් මින් වසර 05ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ (HM) විය යුතුය)"

**<u>වයස :</u>**
අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55 නොවැඩි විය යුතුය.

## 2. අධ්‍යක්ෂ (රැකවරණ) HM 1-3 තනතුරු 01

<u>වැටුප් පරිමාණය</u>
HM 1-3 රු. 152,500.00-15X4,100-214,000.00

<u>මූලික වැටුප් පියවර</u>
**2025.01.01** දිනට ගෙවන මුදල් රු. 113,556.00, **2026.01.01** දිනට ගෙවන මුදල් රු. 133,028.00
**2027.01.01** දිනට ගෙවන මුදල් රු. 152,500.00
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2025/01හි උපලේඛණයට අනුව 2025/01/01-2025/12/31)

**<u>සුදුසුකම් හා පළපුරුද්ද :</u>**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය, අපරාධ විද්‍යාව හෝ සමාජ විද්‍යාව යන විෂයය ක්ෂේත්‍රයන්හි විශේෂ උපාධියක් ලබා තිබීම.

සමඟ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ විෂයය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

ප්‍රථම උපාධි සුදුසුකම් ලැබීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක,ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ අදාළ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක "විධායක/මධ්‍යම කළමනාකරණ මට්ටමේ" විෂයය ක්ෂේත්‍රයට අදාළ තනතුරු වල අවම වශයෙන් වසර 15ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

සමඟ

ශ්‍රී ලංකා පොලිස් සේවයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධාරියෙකු වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

මෙම තනතුර සඳහා වන ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

කළමනාකරණ සේවා (MM) ගණයෙහි 1 ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර 5ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**<u>වයස :</u>**

අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55 නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

## 3. කළමනාකරණ මණ්ඩල ලේකම් MM 1-3 තනතුරු 01

**<u>වැටුප් පරිමාණය</u>** :

MM 1-3 රු. 96,650-10x2,480-15x3,450-173,200

**<u>මූලික වැටුප් පියවර :</u>**

**2025.01.01** දිනට ගෙවන මුදල් රු. 75,143.00, **2026.01.01** දිනට ගෙවන මුදල් රු. 85,896.00

**2027.01.01** දිනට ගෙවන මුදල් රු. 96,650.00

(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2025/01හි උපලේඛණයට අනුව 2025/01/01-2025/12/31)

**<u>සුදුසුකම් හා පළපුරුද්ද :</u>**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම

සහ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ වෘත්තියෙහි අවම වශයෙන් වසර 03ක පලපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

"කණිෂ්ඨ කළමනාකාර" JM සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**<u>වයස:</u>**

අවු:22ට නොඅඩු හා අවු:45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

## 4. සහකාර අධ්‍යක්ෂ රැකවරණ **MM 1-3** තනතුරු 01

<u>වැටුප් පරිමාණය :</u>

MM 1-3 රු. 96,650-10x2,480-15x3,450-173,200

**<u>මූලික වැටුප් පියවර :</u>**

**2025.01.01** දිනට ගෙවන මුදල් රු. 75,143.00 ,**2026.01.01** දිනට ගෙවන මුදල් රු. 85,896.00
**2027.01.01** දිනට ගෙවන මුදල් රු. 96,650.00
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2025/01හි උපලේඛණයට අනුව 2025/01/01-2025/12/31)

**<u>සුදුසුකම් හා පළපුරුද්ද :</u>**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය / අපරාධ විද්‍යාව / මනෝ විද්‍යාව / සමාජ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් වෙනත් උපාධියක් ලබා තිබීම

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01ක පලපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

**<u>වයස:</u>**

අවු:22ට නොඅඩු හා අවු:45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

## 5. රැකවරණ නිලධාරි MA 4 තනතුරු 03

**<u>වැටුප් පරිමාණය :</u>**

MA 4: රු.64,320-10x1,360-15x1,670-5x2,040-113,170

**<u>මූලික වැටුප් පියවර :</u>**

**2025.01.01** දිනට ගෙවන මුදල් රු. 52,875.00 ,**2026.01.01** දිනට ගෙවන මුදල් රු. 58,598.00
**2027.01.01** දිනට ගෙවන මුදල් රු. 64,320.00
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2025/01හි උපලේඛණයට අනුව 2025/01/01-2025/12/31)

**<u>සුදුසුකම් හා පළපුරුද්ද :</u>**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය/අපරාධ විද්‍යාව/මනෝවිද්‍යාව විෂයක් ලෙස ඇතුලත්ව උපාධියක් ලබා තිබීම

හෝ

ශ්‍රී ලංකා පොලිස් සේවයේ පොලිස් පරීක්ෂක ධූරයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධාරියෙකු වීම

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

මෙම තනතුරට අදාළ ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA1) සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර අට (08)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**<u>වයස:</u>**

අවු:22ට නොඅඩු හා අවු:45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

## 6. විමර්ශන නිලධාරි MA 4 - තනතුරු 01

<u>වැටුප් පරිමාණය :</u>
MA 4: රු.64,320-10x1,360-15x1,670-5x2,040-113,170

<u>මූලික වැටුප් පියවර :</u>
**2025.01.01** දිනට ගෙවන මුදල් රු. 52,875.00 ,**2026.01.01** දිනට ගෙවන මුදල් රු. 58,598.00
**2027.01.01** දිනට ගෙවන මුදල් රු. 64,320.00
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2025/01හි උපලේඛණයට අනුව 2025/01/01-2025/12/31)

**<u>සුදුසුකම් හා පළපුරුද්ද :</u>**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ නීතිය හෝ අපරාධ විද්‍යාව විෂයක් ලෙස ඇතුලත්ව උපාධියක් ලබා තිබීම

හෝ

ශ්‍රී ලංකා පොලිස් සේවයේ පොලිස් පරීක්ෂක ධූරයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධාරියෙකු වීම

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

මෙම තනතුරට අදාළ ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA1) සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර අට (08)ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**<u>වයස:</u>**

අවු:22ට නොඅඩු හා අවු:45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

## 7. කළමනාකරණ සහකාර MA1-1 - තනතුරු 01

<u>වැටුප් පරිමාණය :</u>
MA 1-1: රු.46,220-10X540-7X630-4X890X20X1,190-83,390

<u>මූලික වැටුප් පියවර :</u>
**2025.01.01** දිනට ගෙවන මුදල් රු. 40,403.00 ,**2026.01.01** දිනට ගෙවන මුදල් රු. 43,312.00
**2027.01.01** දිනට ගෙවන මුදල් රු. 46,220.00
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2025/01හි උපලේඛණයට අනුව 2025/01/01-2025/12/31)

**<u>සුදුසුකම් හා පළපුරුද්ද :</u>**

**බාහිර අයදුම්කරුවන්**

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදි

1. සිංහල/දෙමළ
2. ගණිතය
3. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයන් හතර (04)කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06)කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ ) විභාගයේදි අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත "ආ,ඇ, සහ ඉ" සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)විභාගයේදි

1. සිංහල/දෙමළ
2. ගණිතය
3. ඉංග්‍රීසි භාෂාව

යන විෂයන් ඇතුළුව විෂයන් හතර (04)කට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හය (06)කින් සමත්ව තිබීම.

හා

පරිගණක වදන් සැකසුම/යතුරු ලියනය පිළිබඳ තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාර තිබීම

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙන් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

<u>වයස:</u>

අවු:18ට නොඅඩු හා අවු:45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**<u>ප්‍රතිලාභ :</u>**

1. ජීවන වියදම් දීමනාව
2. අධිකාරිය විසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% හා සේවක නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3%ක දායක වනු ඇත
3. ඉහත 1,2,3 සහ 4 තනතුරු සඳහා රු.25,000ක මාසික වෘත්තිය දීමනාව
4. ඉහත 1,2,3 සහ 4 තනතුරු සඳහා මාසික දුරකථන දීමනාව
5. ඉහත 1 සහ 2 තනතුරු සඳහා ඉන්ධන දීමනාව සහ නිලරථයක් හෝ මාසික රු.50,000.00 ප්‍රවාහන දීමනාව

ඉල්ලුම්පත් කැඳවන අවසාන දිනට (2025.08.18) මෙම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

පොදු කොන්දේසි

01. සෑම ඉල්ලුම්කරුවෙක්ම

   I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
   II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
   III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

02. ඉහත සුදුසුකම් හා තනතුරට අදාළ පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකපත්වල ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.
03. සේවක අර්ථසාධක අරමුදල සඳහා 8%ක දායකත්වයක් ඔබ විසින් දැරිය යුතුය.
04. අයදුම්කරුවන් විසින් අනිසි බලපෑම් කිරීම හෝ විමසීම් සිදු කිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත.
05. අයදුම්පත් කැඳවීම අවසන් කරනු ලබන දිනට නොලැබෙන සියලු අයදුම්පත් සහ සහතික පත්වල පිටපත් ඉදිරිපත් කර නොමැති සියලු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා සියලු තොරතුරු ඇතුළත් ඔබ විසින් සකස් කරන ලද ජීව දත්ත සටහනක් සියලු සහතික පිටපත් සමඟ ලියාපදිංචි තැපෑලෙන්, **සභාපති, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය,428/11 ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල** යන ලිපිනයට 2025.08.18 දිනට ප්‍රථම ලැබෙන පරිදි යොමු කළ යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

**සභාපති**
**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය,**
**428/11 ඒ, පළමු මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**
**දු. අංක. 0112879539**
**දිනය 2025.07.27**